වෛද්‍යවරියක ලෙසින් පෙනී හිඳිමින් විදෙස්ගතව සිට පැමිණ නිරෝධායනය වන කතුන්ගේ තොරතුරු රැස් කළ බවට සැකකරන කාන්තාවක් පොලිස් අත්අඩංගුවට පත්වූ පුවත විවිධ මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබිණි.
එහිදී ලංකාදීප (07/21) සහ අරුණ (017/20) පුවත්පත් වල එම සැකකාර කාන්තාවගේ වාර්ගිකත්වය "මුස්ලිම්" යැයි දැක්විණි. නමුත් මෙම පුවතම වාර්තාකරණ දිනමිණ (07/21) පුවත් වාර්තාවේ එම සැකකාර කත සම්බන්ධ කිසිදු වාර්ගිකත්වයක් දැක්වී නොතිබුණි.
එසේ නම්, දිනමිණ පුවත් වාර්තාවට අදාළ නොවන වාර්ගිකත්වය, ලංකාදීප සහ අරුණ පුවත් වාර්තාවන්ට අදාළ වූයේ මන්ද? එම වාර්ගිකත්වය එම සිදුවීමට අදාළ වන්නේ කෙසේද? එවැනි අදාළත්වයක් නොමැති නම්, එම අදාළ නොවන වාර්ගිකත්වය සඳහන් කිරීම ඔස්සෙ ලංකාදීප සහ අරුණ පුවත්පත් ආචාර ධර්ම විරෝධී මාධ්‍ය හැසිරීමක් නොපෙන්වන්නේද?
#MediaEthicsSL #lka #sinhalanews #Aruna #Lankadeepa #Dinamina